**අම්පාර නගර සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 19 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 ජූනි 03 දින ද විගණනයට ඉදිරිපත්කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට අම්පාර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

----------------------

සභාව විසින් 2016 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු තැන්පතුවල වටිනාකම රු.12,400,292 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශවල රු.9,421,234 ක් ලෙස දැක්වීම නිසා රු.2,979,058 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් වල වටිනාකම රු.53,390 ක් ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට හිඟහිටි කඩකුලී ආදායම රු.1,274,616 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.946,825 ක් ලෙස දැක්වීම නිසා රු.327,791 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට ලෙජරය අනුව කඩකුලී ආදායම, උසාවි දඩ ආදායම හා මුද්දර ගාස්තු ආදායම රු.5,641,036 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.5,059,086 ක් ලෙස දැක්වීම නිසා රු.581,950 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2016 දෙසැම්බර් 31 දිනට ලෙජරය අනුව වෙළඳ බලපත්‍ර ආදායම රු.1,346,200 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.1,760,000 ක් ලෙස දැක්වීම නිසා රු.413,800 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2016 දෙසැම්බර් 31 දිනට රු.176,000 ක් වූ අක්කර බදු ආදායම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට එකතුකළ අගය මත බදු වටිනාකම රු.3,337,181 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන වල රු.3,106,385 ක් ලෙස දැක්වීම නිසා රු.230,796 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.3 නොසැසඳීම්

**2015** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනොවල සඳහන් අවසන් ශේෂයන් 2016 වර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙස ඉදිරියට ගෙන ඒමේදී එම ශෙෂයන් අතර වෙනස්කම් නිරීක්ෂණය විය. මෙම වෙනස් කිරීම් සඳහා ජර්නල් සටහන් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ගිණුම් විස්තරය | 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | 2016 ජනවාරි 01 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| මුදල් | 8,681,805 | 8,660,667 | 21,138 |
| කොන්ත්‍රාත් ගිවිසුම් ඇප | 422,834 | - | 422,834 |
| පුස්තකාල තැන්පත් | 16,130 | 21,780 | 5,650 |
| වැට් බදු | 3,087,182 | 3,106,386 | 19,204 |
| තානායම සේවා ගාස්තු | 729,626 | 851,193 | 121,567 |
| කාරක ප්‍රාග්ධනය | 32,330,200 | 29,860,792 | 2,469,408 |

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| ගිණුම් විෂය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ණයගැතියෝ | 26,551,896 | ණයගැති කාල විශ්ලේෂණය, ශේෂ සනාථ කිරීමේ ලිපි |
| ණයහිමියෝ | 4,031,236 | ණයහිමි කාල විශ්ලේෂණය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නගර සභාවේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.9,027,064 ක පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,919,316 ක පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,107,748 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වරිපනම් හා බදු, කුලී ආදායම්, සේවා සඳහා ගාස්තු සහ වෙනත් ආදායම යන ආදායම් ශීර්ෂ සියයට 09 සිට සියයට 57 දක්වා පරාසයක වර්ධනයක් ද,

බලපත්‍ර ගාස්තු සහ වරෙන්තු ගාස්තු යන ආදායම් ශීර්ෂ සියයට 16 සිට සියයට 18 දක්වා අඩුවීමක් ද පෙන්නුම් කරයි.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තු, ගමන් වියදම්, සැපයුම් හා උපකරණ යන වියදම් වල සියයට 52 සිට සියයට 432 දක්වා පරාසයක වර්ධනයක් ද, විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ වියදමෙහි සියයට 70 දක්වා අඩුවීමක් ද පෙන්නුම් කරයි.

## 2.3 ආදායම් පරිපාලනය

---------------------

### 2.3.1 වරිපනම් හා බදු

----------------

2012 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා අයකර ගත යුතු වරිපනම් බදු රු.21,144,135 ක් අයකරගෙන නොතිබුණි.

### 2.3.2 කුලී ආදායම්

---------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු කඩකුලී ආදායම රු.946,825 ක් වූ අතර, එම මුදල ද අයකර ගැනීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා එකතු කරන ලද රු.3,337,181 ක එකතුකළ අගය මත බදු මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නිරවුල් කර නොතිබුණි.

(ආ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත අනුව මුද්දර ගාස්තු කාර්තුවක් අවසන්වී දින 15 ක් ඇතුළත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු වුවත්, සභාව විසින් වටිනාකම රු.67,940 ක් වූ මුද්දර බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යවා නොතිබුණි.

(ඇ) 2016 අංක 20 දරන එකතු කළ අගය මත බදු (සංශෝධිත) පනත අනුව බදු අයකළ හැකි ආදායම රු.මිලියන 12 ට වැඩි නම් එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි විය යුතු වුවත්, 2016 වර්ෂය සඳහා සභාවේ බදු අය කළ යුතු ආදායම රු.29,830,800 ක් ලෙස පැවතියද, එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය ලේකම් වෙත අයිතිය ඇති, සභාව විසින් භාවිතා කරන ඉඩම් 39 ක අයිතිය සභාව වෙත පවරාගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඉ) වර්ෂ 02ක් ඉක්මවූ රු.910,164 ක් වටිනා තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 (2) අනුව කටයුතු කර නොතිබුණි.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

### 3.2.1 දැයට කිරුළ වැඩසටහන යටතේ අම්පාර මහජන උද්‍යානය ඉදිකිරීම

-------------------------------------------------------------------

(අ) උද්‍යානයේ මුළුතැන්ගෙය රු.4,432,775 ක් වැය කර ඉදිකර 2014 ජූලි 02 දින සභාව වෙත භාරදී තිබූ නමුත්, 2017 ජූලි 18 දින වනතෙක් එම ගොඩනැගිල්ල නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) උද්‍යානයේ ළමා ක්‍රීඩා උපකරණ සවිකර ඇති ස්ථානයේ බිම ඇතිරීම සඳහා 2014 අගෝස්තු 29 දින රු.352,000 ක් වැය කර මිලදී ගෙන තිබූ රබර් කාපට් භාවිතයට නොගෙන ගබඩා කර තිබුණි.

(ඇ) උද්‍යානය අසල ජැටිය සහ පැති බැම්ම ඉදිකිරීම, රු.මිලියන 02 ක් වියදමින් අවසන් කොට 2014 ඔක්තෝබර් 29 වන දින සභාවට භාරදී තිබුණි. නමුත්, එම ජැටියට අවශ්‍ය බෝට්ටු මිලදී ගැනීමට ලැබී තිබුණු රු.මිලියන 1.5 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් භාවිතා කර නොතිබීම සහ වැවේ ජලය ජැටිය අසලට ගලා නොඑන ආකාරයට ජැටිය ඉදිකිරීම හේතුවෙන් අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------

### 4.1 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම සහ තථ්‍ය වියදම අතර සියයට 02 සිට සියයට 267 දක්වා පරාසයක විචලනයන් පැවැති බැවින්, අයවැය ලේඛනය සඵල කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------------------

2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව සභාව විසින් 2016 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

---------------------------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| පද්ධතිය | | අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍රය |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | - | i. වත්කම් ගිණුම්ගත කිරීම.<br>ii. ජර්නල් සටහන් පිළියෙල කිරීම |
| (ආ) ආදායම් පරිපාලනය | - | i. හිඟ ආදායම් අයකර ගැනීම.<br>ii. අතුරු ව්‍යවස්ථා පැනවීම.<br>iii. ආදායම් ප්‍රභව හඳුනාගැනීම. |
| (ඇ) අයවැය පාලනය | - | අයවැය නිසිලෙස පිළියෙල කිරීම. |
| (ඈ) ගබඩා පරිපාලනය | - | ක්ෂණිකව හරි වැරදි බැලිය හැකි ආකාරයට භාණ්ඩ ගබඩා කිරීම. |
| (ඉ) වත්කම් පාලනය | - | ස්ථාවර වත්කම්වල අයිතිය පවරා ගැනීම. |